පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 09 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසල් නම :.................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සංවාද ඛණ්ඩ ඇසුරින් ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනින් එනවා
මිනිරන් තේරුවොත් ළද නුඹ කළු වෙනවා
ළඟ නම් ගෙදර මුර ඇරුණම මම එනවා

B. දොඩම් කපාලා ඇඹුල් තනාලා - නාන්න යන හැටි බලන් කළු
සේලේ ඇදලා තෙරිය තියාලා - මිදුලේ සක්මන් කරයි කළු

C. පින්වත මගේ සිතට බයයි - අපි කුලයෙන් පහත් අයයි
හෙළලෝලිය යන නම මට - මගේ පියා නිතර කියයි

D. ඉතිං සැනසෙන්න - හොඳින් පුළුවන්නෙ
දෙමව්පියෙ දෙන්න - ඇවිත් අර ඉන්නෙ

E. මමත් හිටියෙ හම්බවෙන්න
එලොව ගිහිං ආපු කෙනෙක්
එහේ ඉන්න මගේ දුවගේ
සුවදුක් දැනගන්න අහලා

1. ඔළිද කෙලිය හා සම්බන්ධ පද්‍ය ඛණ්ඩය දැක්වෙන අක්ෂරය වන්නේ,
   1) A 2) B 3) C 4) D
2. දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍යයක එන පද්‍ය ඛණ්ඩය අයත් අක්ෂරය වන්නේ,
   1) B 2) C 3) E 4) D
3. සාලිය අශෝකමාලා විරිදු පන්තියේ එන පද්‍ය ඛණ්ඩයක් වන්නේ,
   1) C 2) A 3) E 4) B
4. පතල් කර්මාන්තය හා සම්බන්ධ පද්‍ය ඛණ්ඩය අයත් අක්ෂරය වන්නේ,
   1) A 2) B 3) C 4) D
5. '' එලොව ගිහින් මෙලොව ආවා '' නාට්‍යයේ එන පද්‍ය ඛණ්ඩය අයත් වන්නේ,
   1) D 2) E 3) B 4) A

- 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

6. චරිතයක බාහිර ලක්ෂණ ඉස්මතු කිරීම සඳහා වඩාත් සුදුසු ආනුෂංගික කලාවන් වන්නේ,
   1) පසුතල හා චිත්‍ර වස්ත්‍ර යි.
   2) වේෂ භූෂණ හා අංග රචනයයි.
   3) රංගාලෝකය හා පෙළ මතක්කරන්නන්
   4) නාට්‍ය සංගීතය හා රංගාලෝකය.

7. පසුතල නිර්මාණ පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1) සැහැල්ලු සරල ද්‍රව්‍ය භාවිත කිරීම සුදුසු වේ.
   2) මිල අධික ද්‍රව්‍ය වලින් සකස් කල යුතුය.
   3) සෑම නාට්‍යයකටම අත්‍යාවශ්‍ය වේ.
   4) අපතේ යන ද්‍රව්‍ය භාවිතා නොකල යුතුය.

8. ක්ෂණික නිරූපණයක්,
   1) වාචික අභිනයෙන් තොරව ඉදිරිපත් කරයි.
   2) පිටපතකට අනුව ඉදිරිපත් කරයි.
   3) ස්වකීය අත්දැකීම් පරිකල්පනය මෙහෙයවා ඉදිරිපත් කරයි
   4) මනා පුහුණුවකින් යුතුව ඉදිරිපත් කරයි.

9. නාට්‍ය පෙළ පිළිබඳ ඉතා නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1) නාට්‍ය පෙළ කියවා රස විඳිය නොහැකිය.
   2) නාට්‍ය පෙළක් නිර්මාණය කරනුයේ අධ්‍යක්ෂවරයා විසිනි.
   3) නාට්‍ය පෙළක් යනු සාහිත්‍යමය ලියවිල්ලකි.
   4) නාට්‍ය පෙළක ගැටුම අනිවාර්ය නොවේ.

10. අනුකරණය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය පහත සඳහන් ප්‍රකාශ අතුරින් තෝරන්න.
   1) පරිකල්පනය තුලින් නිර්මාණය කර ගත යුතු දෙයක් වීම.
   2) නිරීක්ෂණයකින් තොරව ඉදිරිපත් කළ හැකි දෙයකි.
   3) චරිතයකට පිවිසීම හෙවත් වෙස්වලා ගැනීම.
   4) පුද්ගල චරිතයත්, ක්‍රියාවත් ඒ ආකාරයෙන්ම  කර පෙන්වීම.

- පහත වගුව ඇසුරින් අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| F | G | H | I |
|---|---|---|---|
| ගදභ<br>භික්ෂුව | නාගසේන ස්ථවිර<br>මිලිඳු රජු | දේව දූතයා<br>භික්ෂුව | භික්ෂූන් වහන්සේ<br>ශ්‍රාවකයා |

11. දොරකඩ අස්න බෞද්ධ පූජා කර්මයේ එන චරිත ඇතුලත් වන්නේ,
   1) F  2) G  3) H  4) I

12. ආලවක දමනය බෞද්ධ පූජා කර්මයේ එන චරිත ඇතුලත් වන්නේ,
   1) F  2) G  3) H  4) I

13. " I " අක්ෂරයෙන් දැක්වෙන තීරයේ එන චරිත ඇතුලත් වන බෞද්ධ පූජා කර්මය වන්නේ,
   1) මිලින්ද ප්‍රශ්නය
   2) යුගාසන බණ
   3) සූවිසි විවරණය
   4) සකස් කඩ කියවීම

14. මිලින්ද ප්‍රශ්නය නැමති බෞද්ධ පූජා කර්මයේ එන චරිත ඇතුලත් තීරය වන්නේ,
   1) H  2) G  3) F  4) I

15. බෞද්ධ පූජා  කර්ම තුල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ නොවන්නේ,
   1) සංවාද / අනුකරණය / අනුරූපණය
   2) අනුරූපණය / සමාරෝපය / රංග භාණ්ඩ
   3) ගැටුම / නාට්‍ය පෙළ / රංග විධාන
   4) අභිනය / රංග භූමිය / ප්‍රේක්ෂකයා

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැනට ලියන්න.

16. සජීවි චරිත යොදා ගැනීමෙන් .................................... සකස් කර ගත හැකිය.
17. නාට්‍යයක යොදා ගන්නා අතිරේක .................................... නමින් හඳුන්වයි.

18. අධික තෘෂ්ණාව විනාශයට හේතු වන බව ................................... තේමාව වේ.
19. අංග රචනය මගින් ................................... අභිනය තිව්‍ර වේ.
20. අංග, ප්‍රත්‍යාංග, උපාංග ................................... අභිනයට අයත් වේ.

(කදා වළලු / පසුතල / සාත්වික / ආංගික / ආනුෂංගික)

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

21. නාට්‍ය පෙළක සංවාද වලට අමතරව රංග විධාන, ආනුෂංගික අංග සහ චරිත පිළිබඳ විස්තර දක්නට ලැබේ. ( )
22. නාට්‍ය සංගීතය භාවිත නොකර වුවද නාට්‍ය නිර්මාණයක් සිදු කළ හැකිය. ( )
23. ආනුෂංගික අංග ආහාර්ය අභිනයට අයත් වේ. ( )
24. වේෂ භූෂණ නිර්මාණයේදී ශෛලීය පිළිබඳ සැලකිලිමත් වීම අත්‍යාවශ්‍ය නොවේ. ( )
25. ලෝක ස්වභාවයට අනුගත නොවන අයුරින් සතර අභිනය භාවිත කිරීම නාට්‍යධර්මී ලක්ෂණයකි. ( )

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

26. පර්යේෂණාත්මක කෘතියක් වන ගැමි නාටකය රචනා කරන ලද්දේ,
    1) A  2) B  3) C  4) D
27. E ඡායාරූපය හා සම්බන්ධ සත්‍ය ප්‍රකාශය වන්නේ,
    1) ළමා නාට්‍යකරුවකු ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත.
    2) සිංහබාහු නාට්‍යයේ " සිංහයා" ගේ චරිතය නිරූපණය කරයි.
    3) වෙස්සන්තර ගීත නාටකයේ සක්දෙව් ලෙස රංගනයේ යෙදී ඇත.
    4) රත්තරං නාට්‍යයේ හොරාගේ භූමිකාව රඟදක්වා ඇත.

28. " C " ඡායාරූපය සහ සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1) නවකතා කරුවකු, පරිවර්තකයකු හා ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදකයෙකි.
    2) සිනමා නිර්මාණ සඳහා අධ්‍යක්ෂවරයකු ලෙස ද දායකත්වය ලබා දී ඇත.
    3) පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය මෙන්ම සංගීතමය නාට්‍ය ද ඔහු විසින් නිර්මාණය කොට ඇත.
    4) " හස්ති රාජ මහත්තයා " නම් අසම්මත නාට්‍ය ඔහුගේ නිර්මාණයකි.

29. ඉහත ඡායාරූප අතරින් " යෙර්මා " නැමැති නාට්‍ය සිංහලයට පරිවර්තනය කරන ලද්දේ,
    1) D  2) B  3) E  4) A
30. " නරි බෑණා " දෙවනි නිෂ්පාදනයේ දී නරියාගේ චරිතය නිරූපණය කරන ලද්දේ,
    1) A  2) B  3) C  4) D

- පහත අංක 31 සිට 35 දක්වා නොගැලපෙන පිළිතුරු තෝරන්න.

31. ආගමික කතාවකි.
    1) තලෙන්ත කතාව
    2) වෙස්සන්තර කතාව
    3) යහපත් සමාරිතයාගේ කතාව
    4) ගජමන් නෝනාගේ කතාව

32. පරිකල්පන අභ්‍යාසයක් මගින් ලැබෙන ප්‍රයෝජනයකි.
   1) කටහඬ පිළිබඳ ප්‍රවීනතාවයක් ලබාගත හැකිවීම.
   2) සාමාන්‍ය ජීවිතයට උපකාරී විම.
   3) නිර්මාණශීලි භාවය වැඩිදියුණු වීම.
   4) යමක් දෙස අළුතින් බලා සිතීමේ හැකියාව වැඩිවීම.

33. ආහාර්ය අභිනයට අයත් වේ.
   1) අංග රචනය
   2) පසුතල නිර්මාණ
   3) නාට්‍ය ගීත
   4) වේෂ භූෂණ

34. නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලියට අයත් වේ.
   1) සිංහබාහු
   2) මනමේ
   3) නරිබෑනා
   4) මෝදර මෝල

35. නාට්‍ය පෙළක අන්තර්ගත වේ.
   1) ගැටුම් අවස්ථා සහිත සිදුවීම්
   2) වේෂ භූෂණ පිළිබඳ විස්තර
   3) පසුතල නිර්මාණ පිළිබඳ විස්තර
   4) සංවාද හා රංග විධාන

- අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යා කරන්න.

36. ආනුෂංගික කලා — සංවාද / ගීත
37. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර — වෙල්ල වැහුම් / බනින කලාව
38. සාත්වික අභිනය — අංග රචනය / වේෂ භූෂණ
39. වාචික අභිනය — රාක්ෂයෙක් ගමට ඇවිත් / පෙරලුණු ඔරුව හරවමු
40. රංග ක්‍රීඩා — කඳුළු සැලීම / සිනහසීම

(ලකුණු 1 X 40 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. '' කදා වළලු '' නාට්‍ය පෙළ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. '' කදා වළලු '' නාට්‍යය මුල් වරට රඟදක්වන ලද්දේ කවදාද?
2. මෙම නාට්‍යයට පාදක වූ ජාතක කතාව නම් කර ඇත්තේ කුමන වෙළෙන්දාගේ නාමයෙන් ද?
3. මෙම නාට්‍යයේ එන '' පසුම්බිය කිසිල්ලේ ගසන්නා '' යන අරුත පටබැඳි චරිතය නම් කරන්න.
4. මෙම නාට්‍යයේ එන පරමාදර්ශී වෙළෙන්දෙකුගේ චර්යාවන් පෙන්වන අවස්ථාවක් ලියන්න.
5. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන නාට්‍යෝපකරණ 2ක් නම් කරන්න.
6. මෙම නාට්‍යයේ මුල් නිෂ්පාදනයේ දී භාවිත කළ '' හනමිච්ය '' යනු කුමක් ද?

ලකුණු : (2 x 6 =12)

02.

1. සමාරෝපය යනු කුමක් ද? (ල. 02)
2. සමාරෝපය කොටස් දෙක නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)
3. සමාරෝප කාර්යයේ දී නළුවා සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න. (ල. 06)

03.

1. නාට්‍යයක ගැටුම යනු කුමක්ද? (ල. 02)
2. ගැටුම් ප්‍රභේද නම් කරන්න. (ල. 04)
3. ඉහත ගැටුම් ප්‍රභේදයන් ඔබ දන්නා නාට්‍යයක් ඇසුරින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

04.

1. භූමිකා යනු මොනවාද? (ල. 02)
2. ඔබ කැමති චරිතයක් තෝරාගෙන භූමිකා සටහනක් ඇද දක්වන්න. (ල. 04)
3. භූමිකා රංගනයේ දී නළු නිළියන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ල. 06)

05.



1. ඉහත ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරු නම් කරන්න. (ල. 02)
2. එතුමාගේ නාට්‍ය නිර්මාණ 04 ක් නම් කරන්න. (ල. 04)
3. ඔහුගෙන් නාට්‍ය කලාවට සිදු වූ සේවය අගයන්න. (ල. 06)

06.

1. '' රංග අභ්‍යාස '' යනු මොනවාද? (ල. 02)
2. ඔබ දන්නා රංග අභ්‍යාස 04 ක් නම් කරන්න. (ල. 04)
3. රංග අභ්‍යාස සිදු කිරීමෙන් ආධුනික නළු නිළියන්ට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ල. 06)

07. පහත දී ඇති සිදුවීම පාදක කරගෙන නාට්‍යයකට සුදුසු පෙළ රචනයක් කරන්න.

'' අමල් ඉතා දිළිඳු පවුලක වැඩිමහල් පුතා ය. ඔහුට මල්ලිලා දෙදෙනෙකු සහ නැගණියක සිටී. ඔහුගේ පියාට මවට ස්ථිර රැකියා නොමැති අතර කුලී වැඩෙන් සොයා ගන්නා මුදල ඔවුන්ගේ ජීවිකාව ගෙන යාමට ද මදිය. දිනක් අමල් පවුලේ අය සමග පන්සලට ගිය විට එහි ගලවා තිබූ ඉතා අලංකාර කුඩා පාවහන් යුගලක් දැක එය ඉල්ලා අමල්ගේ නැගණිය අඩා වැටෙන්නට විය. මව පියා නැගණිය සනසා එතැනින් ඉවතට රැගෙන ගිය ද නැගණිය ගැන සොවින් අමල් පාවහන් යුගල දෙස බලාගෙන සිටියා ය. ඔහු සිටි ස්ථානයේ පිරිස අඩු වූ මොහොතක අමල් පාවහන් යුගල ලගට ගොස් එය ගැනීමට සැරසෙත්ම ......... ''

1. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංගවිධාන සමග සංවාද රචනය කිරීම සඳහා (ල. 04)
2. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ල. 04)
3. නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ල. 04)